මගේ අංකය : TF/AD/03/25
2026.09.24

**<u>ටවර් හෝල් රඟහල පදනමේ නාට්‍ය පාසල සඳහා අත්‍යාවශ්‍ය සංගීත භාණ්ඩ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීමට අදාල දින දීර්ඝ කිරීම</u>**

ටවර් හෝල් රඟහල පදනම නාට්‍ය පාසල සඳහා අත්‍යාවශ්‍ය සංගීත භාණ්ඩ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා තිබූ අතර,එහි ලංසු භාරගන්නා අවසන් දිනය 2026.10.09 දින දක්වා දීර්ඝ කල බව කාරුණිකව දන්වා සිටිමි.ඊට අදාළ ලංසු ලියවිලි හා කොන්දේසි ටවර් හෝල් රඟහල පදනම වෙබ් අඩවියේ (WWW.towerhall.lk)පලකර ඇති අතර එම ලංසු ලියවිලි හා කොන්දේසි බාගත කර හෝ ටවර් හෝල් රඟහල පදනම ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගෙන මිල ගණන් ඉදිරිපත් කළ හැක.

ඒ අනුව අදාළ මිල ගණන් නියමිත ආකෘතියේ සඳහන් කර මුද්‍රා තබා වර්ෂ 2026.10.09 දින පෙ.ව 11.00 ට පෙර **"සභාපති ප්‍රසම්පාදන කමිටුව, ටවර් හෝල් රඟහල පදනම, සව්සිරිපාය, අංක 123, විජේරාම මාවත, කොළඹ 07"**යන ලිපිනයෙහි පිහිටි ටවර් හෝල් රඟහල පදනම ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් බාහාලනයට අතින් ගෙනවිත් හෝ එදින පෙ.ව 11.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මිල ගණන් ලබා ගැනීම අවසන් වූ සැනින් මිල ගණන් විවෘත කරනු ලබයි. ප්‍රමාද වී ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසු විවෘත කරන අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් අයෙකුට සහභාගී විය හැකිය.

මිල ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ " **සංගීත භාණ්ඩ සඳහා මිල ගණන්"**ලෙස සඳහන් කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

නිපුණ දිසානායක
අධ්‍යක්ෂ(පාලන හා සංවර්ධන)

දු.ක : 0112682324
ෆැක්ස් අංකය : 0112678517
විද්‍යුත් කැපැල : towersl@sltnet.lk